# මගේ සීයාගේ අරුම පුදුම ගෙවත්ත



එල්.පී. සනුති ගිහංගා

කෘතියේ නම : මගේ සීයාගේ අරුම පුදුම ගෙවත්ත

කතෘගේ නම : එල්.පී. සනුති ගිහංගා

ශ්‍රේණිය : 6 ශ්‍රේණිය D

කතෘ අයිතිය : එල්.පී. සනුති ගිහංගා

ISBN අංකය : 978-624-208-459-6

කෘතිය පල කරන දිනය : 2025.02.08

# පිදුම

මට සිප්සතර හැදෑරීමට ඉඩහසර

ලබා දුන් මාගේ ගරු විදුහල් මහමායා මාතාවට

මාගෙ මේ කෘතිය ගෞරවයෙන්

සෙනෙහසින් පුද කරමි.

තවද, මාගේ දයාබර ගුරු මෑණිවරුන්ට,

මාගේ දෙමාපියන්ට ද මිතුර මිතුරියන්ට ද

ආදරයෙන් පුද කර සිටිමි

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

දිනක සවසක මා පාසල් ඇරී ගෙදර ආවේ ඉතා බඩගිනි


වී යකෙක් කන්න පුළුවන් තරම් බඩ කැගසමින් ය.

ඉන්පසු ගෙදරට ගොඩවන විටම කෑම මේසේ


දිව පිනා යන රසකින් සුවඳකින් පිරී තිබිණි.



ඉන්පසු මා පාසල් නැතුව මාරු කර ඇඟපත සෝදා මාගේ මල්ලි නංගී සමග කෑම මේසයට ඉඳගත්තෙමු. අම්මා කෑම මේසේ සකසා තිබුණේ රතු හාලේ බතට වට්ටක්කා කිරට සාදා ගොටු කොළ සම්බෝල වැවු මාළු ව්‍යාංජනයක් සමග කැකිරි මාළුව මිරිසට සාදා කරපිංචා කොල බැද පපඩම් සමඟය. මේසේ කෙළවර තිබුණේ ඉතා හොඳට ඉදුණු සීනි කෙසෙල් සහ පැපොල් ය. ඉතින් මං ඔබට කියන්න යන්නේ මේ සියලුම එළවළු පලතුරු මෙන්ම පලා වර්ග අම්මා සකස් කර තිබුණේ මාගේ සීයාගේ ගෙවත්තෙනි.



මගේ සීයා සෑම දිනකම සවස් වරුව ගත කරන්නේ ගෙවත්තේය. ඔහු දිනකට පැය 3ක් පමණ එහි සිටියි. සීයා කියන්නේ ඔහු එහි යාමෙන් ගෙවත්තේ වැඩ කිරීමෙන් සීයාගේ මනසට මෙන්ම කායිකවද ඉතා යෝග්‍ය බවයි. මනසට මෙන්ම කායිකව නිරෝගී බවද ගෙවත්තේ වැඩ කිරීම ඉවහල් වන බව ඔහු නිතර පවසයි.




සීයා බෝග වගා කර ඒවාට පොහොර

දමා සාදා ගන්නා කාබනික පොහොර වලිනි.


විදුලෙහි වැටෙන දිරාපත් වන කොළ අතු කොම්පෝස්ට්

බඳුනකට දමා ඒවා දිරාපත් කර එහි ඇතිවන

පොහොර ගෙවත්තේ බෝගවලට සීයා දමනු ලබයි.



ඉතිං මගේ සීයාගේ ගෙවත්තේ පිපිඤ්ඤා, වම්බටු, මිරිස්, මෑකරල් සහ කැකිරි යන ඵලවලු වගා කර ඇති අතර තවද ඔහු පලා වර්ග ලෙස ගොටුකොළ සහ කංකුං වගා කට ඇත. කෙසෙල් සහ පැපොල් යන පලතුරු දෙවර්ගයක් ද වගා කර ඇත.
සීනි කෙසෙල්, ආනමාළු, කෙසෙල් අතර වේ.



අප ගෙදර බොහෝ ලෙස කෑමට ගනු ලබන්නේ

සීයාගේ ගෙවත්තේ ඇති එළවළු, පලතුරු, සහ පලා

වර්ගයි. ඒවා ඉතාම කිරි රසැති වන අතර ඉතා

සෞඛ්‍යමත් ගුණදායක බව මට මනා ලෙස හැඟේ.

සීයාගේ ගෙවත්තේ ඒ ආකාරයට එලදාව ගන්නට

ඔහු ඉතා වෙහෙස මහන්සි වී වැඩ කරයි.

නිතර ඒවාට අවශ්‍ය වලවල් කපා බෝග සිටුවයි.

ඉන් පසු භෝග වැඩෙත්ම ඒවා කෘමීන්ගෙන්

පරිස්සම් කිරීමට ද මහත් වෙහෙසක් දරනු ලබයි.

මා දැක ඇති අන්දමට ඔහු ඒවාටද යොදන්නේ ඔහු

විසින්ම සදා ගන්නා කෘමිනාශක දියරයන් ය.

උදාහරණයක් ලෙස කරවිලා හොඳට තලා යුෂ සාදා

එම යුෂ භෝග වලට ඉසී. එවිට විවිධ කෘමීන් ඒම වැලකේ.

පැල ටික ටික ලොකු වන විට ඒවා අව්වෙන්ද

පරිස්සම් කරයි. ඒවා එල දැරීමට සීයා

එම භෝග තම දරුවන් සේ මනා ලෙස රැක

බලා ගනියි. ඔහු ඒ සියල්ල කරන්නේ ඉතා සතුටෙන් ය.


ඉතින් මගේ සීයාගේ ගෙවත්තට මාද ඔහු සමඟ යන්නෙමි.

එය දකින විටත් මටද ලොකු ආසාවක් සතුටක්

මෙන්ම සීයා ගැන ආඩම්බරයක් දැනේ.

එලදාව දැකීමෙන් සීයා සතුටු වන අතර ගමේ

අයටද වූ ඒවා බෙදා දෙන්නේ ඉතා ආසාවෙනි.



මාහට ඔබට කියන්නට ඒ අවසාන වශයෙන්

ගෙවත්තක් තිබීමෙන් එය අපේ

පවුලේ ආර්ථිකයටද සෞඛ්‍යයට ද

වගේම අපගේ මානසික සුවයට ද ඉතා බලපාන බවයි.

වස විස නැති කෑමක් අපට අපේ ගෙවත්තෙන්

ලබා ගැනීම මහඟු භාග්‍යයකි.

එම රස ගුණ මෙන්ම සෞඛ්‍යමත් එළවළු පලා

පළතුරු මටත් මල්ලිටත් නංගිටත් වගේම මගේ පවුලට

ලබා දීම ගැන මගේ සීයාට ස්තූතිවන්ත වෙමි.

ඔබත් මමත් අපිට පුළුවන් හැකි අයුරින් ගෙදරම කුඩාවට

ගේ බඳුනක හෝ බෝගයක් සිටවා එහි ඵලදාවක්

ලබා ගැනීමට සිතට ගමු.



පරිසරය සුරකිමු. පරිසරයට ආදරය කරමු. පරිසරය රැක හොත් අප රැකෙන බව අපි හොදින් දනිමු.

එම නිසා නිතරම ඔබ පරිසර හිතවාදියෙකු ලෙස ජීවත් වන්නට සිතට ගන්න. පරිසරයේ පණ මෙන් රකින්නට නිතර සිහි තබාගන්න.

ඉදිරි අනාගතයේ බාරගන්න දරුවන් ලෙස අප මේ සඳහා දායක වෙමු.

පැලයක් සිටුවා ඔබත් පරිසරයේ රැකුමට දායක වෙන්න.



පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කළාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්


ISBN: 978-624-208-459-6